## 2026 වර්ෂයට අදාළ වත්කම් බදු දීම සඳහා 03 වන වර ප්‍රසම්පාදන කැඳවීම.

### කුරුණෑගල ප්‍රාදේශීය සභාව .

කුරුණෑගල ප්‍රාදේශීය සභාවට අයත් මෙහි පහත උප ලේඛනයේ දැක්වෙන මස්කඩ, මාළු කඩ, සතිපොළවල් , වගා කිරීමට සුදුසු ඉඩම් හා පොල් ඵලදාව සහිත ඉඩම් 2026.01.01 දින සිට 2026.12.31 දින දක්වා කාල සීමාවට බදු දීම සඳහා මා විසින් තුන්වන වරටත් ප්‍රසම්පාදන කැඳවනු ලැබේ.

01. ප්‍රසම්පාදන පෝරම 2025.11.24 වන දින සිට 2025.12.15 වන දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව 9.00 සිට ප.ව.03.00 දක්වා පමණක් කුරුණෑගල ප්‍රාදේශීය සභා කාර්යාලයෙන් ලබාගත යුතුය .

02. 2025.12.16 වන දින ප.ව. 2.00 දක්වා පමණක් ප්‍රසම්පාදන පෝරම භාරගනු ලබන අතර, එදිනම ප.ව. 2.30 ට ප්‍රසම්පාදන මණ්ඩලය ඉදිරියේ දී ඒවා විවෘත කරනු ලැබේ.

03. මෙම ඉල්ලුම්පත් ආකෘතිපත්‍ර දෙකකින් යුක්තව නිකුත් කරනු ලබන අතර, පහත උපලේඛනයේ සඳහන් පරිදි නියමිත ලංසු ඇප හා පෝරම ගාස්තු ගෙවීමෙන් පසු නිකුත් කරනු ලබන ප්‍රසම්පාදන පෝරම සම්පූර්ණ කර වෙන වෙනම ලියුම් කවර දෙකක බහා මුල් පිටපත හා දෙවන පිටපත ලෙස පැහැදිළිව කවරයේ වම් පස සටහන් කල යුතුය. ඉන්පසු එම ලියුම් කවර දෙක එකම කවරයක බහා **" සභාපති, කුරුණෑගල ප්‍රාදේශීය සභාව, පුත්තලම් පාර, උඩදිගන, කුරුණෑගල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ කාර්යාලයේ ඇති ප්‍රසම්පාදන පෙට්ටියේ තැන්පත් කිරීම කළ යුතුය.

04. ප්‍රසම්පාදන පෝරම නිසි ලෙස සම්පූර්ණ කළ යුතු අතර, ප්‍රසම්පාදන පෝරම බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **ප්‍රසම්පාදන විෂයේ නම හා කඩ කාමරයේ අංකය** වශයෙන් පැහැදිළිව සටහන් කළ යුතුය . සියලු ප්‍රසම්පාදන පෝරම පත් ඒ ඒ වත්කම්වලට අදාලව අවම ලංසුවෙන් ඉහළට ඉල්ලුම් කළ යුතුය. අවම ලංසුවට අඩුවෙන් ඉදිරිපත් කරන ප්‍රසම්පාදන පෝරම ප්‍රතික්ෂේප කරන අතර , ඇප මුදල් සභාව සතු කරනු ලැබේ.

05. ප්‍රසම්පාදන පෝරම නිකුත් කිරීමේ දී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර ආපසු නොගෙවනු ලබන ප්‍රසම්පාදන පෝරම ගාස්තුව උපලේඛනයේ සඳහන් පරිදි ගෙවිය යුතුය.

06. මීට අමතරව සෑම ප්‍රසම්පාදන පෝරමයක් සමගම පහත සඳහන් පරිදි ලංසු ඇපයක් ද ඉදිරිපත් කළ යුතුය. ලංසු ඇපකරය නොමැතිව ඉදිරිපත් කරණු ලබන ප්‍රසම්පාදන පෝරම ප්‍රතික්ෂේප කරනු ලැබේ .

අවම ලංසුව රු 100,000.00 දක්වා ඉන් 10% ක් .

අවම ලංසුව රු . 100,001.00 සිට රු. 500.000.00 දක්වා ඉන් 8% ක් .

අවම ලංසුව රු . 500,001.00 සිට රු. 2000.000.00 දක්වා ඉන් 5% ක් .

- ලංසු ඇපය **මුදලින්** තැන්පත් කළ යුතුය.

ජයග්‍රාහී ප්‍රසම්පාදනකරු නියමිත ගිවිසුම අත්සන් කළ පසු අවම ලංසුවට වැඩි ඉහල ලංසුවක් ඉදිරිපත් කළ අයගේ ලංසු ඇපකරය නිදහස් කරනු ලබන අතර, ප්‍රසම්පාදන පෝරමපත් ලබාගෙන ප්‍රසම්පාදන පෝරම ඉදිරිපත් නොකළ අයගේ හා අවම ලංසුවට වඩා අඩුවෙන් ලංසු තබන හෝ ප්‍රසම්පාදන කොන්දේසි උල්ලංගනය කරනු ලබන ලංසුකරුවන්ගේ හා නියමිත දිනට ගිවිසුමට නො එලබෙන ප්‍රසම්පාදන කරුවන්ගේ ලංසු ඇපකරය සභාව සතු කරනු ලැබේ .

**ප්‍රසම්පාදන කොන්දේසි :-**

01. කුරුණෑගල ප්‍රාදේශිය සභාව මගින් අසාධු ලේඛණ ගත අයට හා කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ වත්කම් හා දේපල බදු ගෙන තිබී අතරමග අතහැර දමන ලද හෝ ප්‍රාදේශීය සභාව සමග එලඹි ගිවිසුම් කඩකර ඇති අයට ඉල්ලුම්පත් නිකුත් කරනු නොලැබේ .

02. මස් කඩ හා මාළු කඩ පවත්වාගෙන යා යුත්තේ ප්‍රාදේශීය සභාවට අයත් කඩ කාමරවලය .

03. මස්කඩවල විකිණීමට තබා ඇති මස් , ආවරණය සහිතව එල්ලා නොතැබුව හොත් මස් හිමියන්ගේ බලපත්‍රය තහනම් කිරීමට කටයුතු කරනු ලැබේ .

04. මස්කඩ හා මාළු කඩ සඳහා වාර්ෂික බලපත්‍රය පිරිනමනු ලබන්නේ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරිගේ නිර්දේශය මතය .

05. සාර්ථක ප්‍රසම්පාදන කරුවන්ට ප්‍රසම්පාදනපත් පිළිගත් බව දන්වා එවීමෙන් පසු අදාල ප්‍රසම්පාදන මුදලින් මාස හතරකට සමාන මුදලක් ආරක්ෂිත ඇප වශයෙන් තැන්පත් කළ යුතුය . එසේ කිරීමට අපොහොසත් වන ප්‍රසම්පාදනකරුවන්ගේ ප්‍රසම්පාදන පෝරම නියමිත දිනෙන් පසුව අහෝසි වූවා සේ සලකා ක්‍රියාකරනු ලැබේ .

15. බදුකරුගේ වියදමින් ප්‍රාදේශීය සභාවේ එකඟතාවය මත "මෙය ප්‍රාදේශීය සභාව සතු ඉඩමකි ,තාවකාලික බෝගවගාව සඳහා / පොල් එළදාව නෙලා ගැනීම සඳහා බදු ලබා දී ඇත" යනුවෙන් ස්ථිර පුවරුවක් සවිකළ යුතුය.

16. සෑම සාර්ථක ප්‍රසම්පාදනකරුවෙක්ම ඉහත දැක්වූ කොන්දේසි හා ප්‍රාදේශීය සභාව විසින් වරින්වර පනවනු ලබන කොන්දේසිවලට යටත්විය යුතු අතර , බලපවත්නා අතුරු ව්‍යවස්ථාවන්ට අනුකූලව කටයුතු කිරිමට එකග විය යුතුය .

17. කිසියම් ටෙන්ඩරයක් මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය කුරුණෑගල ප්‍රාදේශීය සභාව සතු වේ .

18. ප්‍රසම්පාදන අයදුම්පත්‍ර ලබාගැනීමේ දී ජාතික හැදුණුම්පත ඉදිරිපත් කළ යුතුය.

19. බදු දිම සඳහා තැන්පත්කර ඇති ආරක්ෂිත ඇප තැන්පත් මුදල් වර්ෂය අවසාන වනතෙක් රදවා ගනු ලැබේ.

20. පවත්නා වර්ෂයේ ආරක්ෂිත ඇප තැන්පත් ඉදිරි වර්ෂය සඳහා හිලව් කරනු නොලැබේ .

(උපලේඛනය යාකර ඇත.)

සභාපති

කුරුණෑගල ප්‍රාදේශීය සභාව ,

පුත්තලම් පාර

උඩදිගන.

06. සතිපොලවල් , මස්කඩ , මාළු කඩ හා කඩකාමර සඳහා ප්‍රසම්පාදනකරුවන් ඇප මුදල් තැන්පත් කරන අවස්ථාවේ දී ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලබන ආකාරයට ගිවිසුම් වලට බැඳිය යුතුය . මස්කඩ ප්‍රසම්පාදනකරුවන්ට ගෝඝාතක ආඥා පනතේ විධිවිධානවලට අනුව විරෝධතා කැඳවීමෙන් අනතුරුව , ගිවිසුම් අත්සන් කිරීමට කැඳවනු ලැබේ . විරෝධතා පරීක්ෂණයෙන් පසු එහි ප්‍රතිඵල අනුව ප්‍රාදේශීය සභාවේ අභිමතය පරිදි තීරණ ගැනීමේ අයිතිය ප්‍රාදේශීය සභාව සතුවේ. සෑම සාර්ථක ප්‍රසම්පාදනකරුවෙක්ම ගිවිසුම් අත්සන් කිරීමට නියම කළ දිනට එම ගිවිසුම්පත් අත්සන් කිරීමට අපොහොසත් වුවහොත් , එම අයගේ ප්‍රසම්පාදන පෝරම අවලංගු කොට ඔවුන් විසින් තැන්පත්කර ඇති ලංසු ඇපකරය සභාව සතු කරනු ලැබේ . සෑම සාර්ථක මස්කඩ හා මාළු කඩ බදු කරුවෙක්ම ප්‍රාදේශීය සභාව මගින් නියම කළහොත් , නිශ්චල දේපල ඇපයක් ඇප වශයෙන් තැබිය යුතුවේ .

07. සභාව සතු මස් කඩ හා මාළු කඩ මෙන්ම කඩ කාමර බදුකරුවන් විසින් එම කඩ කාමරවල භාවිතා කරනු ලබන විදුලිය වෙනුවෙන් මාසික බිල්පත් හා නඩත්තු ගාස්තු ගෙවීමටද බදු කරු බැඳී සිටී .

08. ප්‍රාදේශීය සභාව සතු ගොඩනැගිලි නොමැති ස්ථානවල අදාල ව්‍යාපාර පවත්වාගෙන යාමට සාර්ථක ප්‍රසම්පාදනකරුවන් විසින් කටයුතු කරන විට එම ගොඩනැගිලි ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලබන ආකාරයට සකස් වී තිබිය යුතුය .

09. සභාව සතු නිශ්චල දේපල සහ වෙනත් බදු දීම් සම්බන්ධයෙන් මස් කඩ , මාළු කඩ , සති පොලවල් , වෙළඳ ස්ථාන හැර ප්‍රසම්පාදිත මුදල් එකවර ගෙවිය යුතුය .

10. ප්‍රාදේශීය සභාවේ ලිඛිත අවසරයක් නොමැතිව කඩ කාමර වෙනස් කිරීම, නවීකරණය කිරීම හෝ අලුතින් කොටස් එකතු කිරීම නොකළ යුතුය.

11. සෑම බලපත්‍ර ලාභී මස් / මාළු කඩ හිමියෙක්ම රජය විසින් ප්‍රසිද්ධ කරනු ලබන දිනවලදී ගෝඝාතනය හා මස් මාංශ වෙළඳාමෙන් සම්පූර්ණයෙන්ම වැලකී සිටිය යුතුය .

12. කඩ කාමර බදු කරුවන් විසින් තමන් සිදු කරනු ලබන ව්‍යාපාරය නිශ්චිතව සඳහන් කල යුතු අතර, පසුව එය වෙනස් නොකල යුතුය.

13. වගා කටයුතු සඳහා පොදු ඉඩම් බදු දීමේ දී, එම ඉඩමේ තාවකාලික බෝග වගා කර ගැනීම සඳහා පමණක් බලය පැවරේ.

14. පොදු ඉඩම්වල පොල් ඵලදාව බදු දීමේ දී, පොල් ඵලදාව නෙලා ගැනීම සඳහා පමණක් බලය පැවරෙන අතර එම ඉඩමේ යම් ඉදිකිරීමක්, වෙනස් කිරීමක් හෝ කැණීම් කටයුත්තක් සිදු කිරීමට බලයක් නොමැත.

## 2026 වර්ෂය සඳහා තෙවන වර ටෙන්ඩර් කැඳවන වත්කම්

| අනු අංකය | වත්කම | 2026 වර්ෂය සඳහා අවම ලංසුව | ටෙන්ඩර් පෝරම ගාස්තු | ආපසු ගෙවනු ලබන ලංසු ඇපය |
|---|---|---|---|---|
| 1 | වැල්ලව සතිපොළ මාළු කඩය (අංක 02) | 19100.00 | 500.00 | 1910.00 |
| 2 | වැල්ලව සතිපොළ මාළු කඩය (අංක 03) | 19520.00 | 500.00 | 1960.00 |
| 3 | වැල්ලව සතිපොළ මාළු කඩය (අංක 04) | 19520.00 | 500.00 | 1960.00 |
| 4 | වැල්ලව සතිපොළ කුකුළු මස් කඩය (අංක 01) | 12800.00 | 500.00 | 1280.00 |
| 5 | වැල්ලව සතිපොළ කුකුළු මස් කඩය (අංක 02) | 13180.00 | 500.00 | 1320.00 |
| 6 | වැල්ලව සතිපොළ ඌරු මස් කඩය | 19680.00 | 500.00 | 1970.00 |
| 7 | මාස්පොත සතිපොළ කුකුළු මස් කඩය (අංක 01) | 17020.00 | 500.00 | 1710.00 |
| 8 | මාස්පොත සතිපොළ කුකුළු මස් කඩය (අංක 02) | 17020.00 | 500.00 | 1710.00 |
| 9 | මාස්පොත සතිපොළ ඌරු/එළු මස්/එළහරක් මස් කඩය (අංක 01) | 18522.00 | 500.00 | 1860.00 |
| 10 | මාස්පොත සතිපොළ ඌරු මස් කඩය (අංක 02) | 19450.00 | 500.00 | 1950.00 |
| 11 | රොෂිටාවත්ත පොදු ඉඩම පොල් එලදාව | 7650.00 | 500.00 | 770.00 |
| 12 | වැලිගොඩෙවත්ත පොල් එලදාව | 6050.00 | 500.00 | 610.00 |
| 13 | එබේවත්ත පොල් එලදාව | 31900.00 | 500.00 | 3200.00 |
| 14 | රංගම නෙළුම් පොකුණ (ii)(ග්‍රීන්වේ)වෙන්දේසි ඉඩමේ පොල් එලදාව | 13860.00 | 500.00 | 1390.00 |
| 15 | දම්මඩවත්ත පොදු ඉඩමේ පොල් එලදාව | 8090.00 | 500.00 | 810.00 |
| 16 | හංවැල්ල පොදු ඉඩමේ පොල් එලදාව | 4620.00 | 500.00 | 470.00 |
| 17 | යග්ගපිටිය පොදු ඉඩමේ පොල් එලදාව | 6930.00 | 500.00 | 700.00 |
| 18 | රණවන පොදු ඉඩමේ පොල් එලදාව | 2541.00 | 500.00 | 260.00 |
| 19 | කාමල් වත්න පොදු ඉඩමේ පොල් එලදාව | 4400.00 | 500.00 | 440.00 |
| 20 | මරළුවාව පොල් ගොල්ල වත්ත ඉඩමේ පොල් එලදාව | 5280.00 | 500.00 | 530.00 |
| 21 | බෝයගනේ පොදු කඩ කාමර අංක1/7 | 9550.00 | 500.00 | 960.00 |
| 22 | බෝයගනේ පොදු වෙළඳපොළ කඩ කාමර අංක 2/7 | 10810.00 | 500.00 | 1100.00 |
| 23 | බෝයගනේ පොදු වෙළඳපොළ කඩ කාමර අංක 6/7 | 9530.00 | 500.00 | 960.00 |
| 24 | බෝයගනේ පොදු වෙළඳපොළ කඩ කාමරි අංක 7/7 | 9430.00 | 500.00 | 950.00 |
| 25 | බෝයගනේ පොදු වෙළඳපොළ කඩ කාමර අංක 8/7 | 12790.00 | 500.00 | 1280.00 |
| 26 | ප්‍රධාන කාර්යාලයේ කාය වර්ධන මධ්‍යස්ථානය | 384000.00 | 500.00 | 30720.00 |
| 27 | බොරළුව වත්ත පොදු ඉඩමේ පොල් එලදාව 01 | 1650.00 | 500.00 | 170.00 |
| 28 | බොරළුව වත්ත පොදු ඉඩමේ පොල් එලදාව 02 | 5500.00 | 500.00 | 550.00 |
| | | | | |
| | වගා කටයුතු සඳහා පොදු ඉඩම් බදු ලබා දීම | | | |
| 29 | රත්කරව්ව කිවුල වැව අසල ඉඩම | 2480.00 | 500.00 | 250.00 |
| 30 | ගෝනගම වත්ත (මාර්ක් බෙන්ජමින්) | 3300.00 | 500.00 | 330.00 |
| 31 | හෙල්ගම වත්ත පොදු ඉඩම | 6300.00 | 500.00 | 630.00 |
| 32 | උයන්දන සිටි පැරඩයිස් පොදු ඉඩම | 3780.00 | 500.00 | 380.00 |
| 33 | මැල්ලවත්ත වියානා ඇවනිව් පොදු ඉඩම | 4000.00 | 500.00 | 400.00 |
| 34 | වැලගනේ ග්‍රීන් විලේජ් පොදු ඉඩම | 5000.00 | 500.00 | 500.00 |
| 35 | මාස්පොත සතිපොල ඉදිරිපිට කඩ කාමර අංක 02 | 252000.00 | 1000.00 | 20160.00 |
| 36 | මාස්පොත සතිපොල ඉදිරිපිට කඩ කාමර අංක 04 | 252000.00 | 1000.00 | 20160.00 |